G.C.E. ADVANCED LEVEL
BIOTECH
BIOSYSTEMS TECHNOLOGY
ජෛව පද්ධති තාක්ෂණවේදය

**2022**

**ADVANCED LEVEL**

# PAPER CLASS REVISION

## උසස් පෙළ
# ජෛව පද්ධති තාක්ෂණවේදය

## ප්‍රශ්න පිළිතුරු ඇසුරෙන් සිදුකෙරෙන
## ඒකක පුණරීක්ෂණ පාඨමාලාව

**Tute No : 01**

Name / Index No :

Institute :

අපි
අනාගතයට
සමීපයි...


දේවින්ද විජේකෝන්
M.Sc.(Peradeniya) B.Sc.(Jayawardanapura)

ඒකකය තුළ සුලභව අසනු ලබන හා බොහෝ ගැටළු ඇතිකරන MCQ වර්ගයේ ප්‍රශ්න මෙම කොටස තුළදී විවරණ සහිතව අධ්‍යයනය කෙරේ.

**MCQ | 66 | S | I**

**ආදර්ශ බහුවරණ විවරණය**

(01) බිත්තරයක බහුලවම අඩංගු සංඝටකය වනුයේ,

1. ප්‍රෝටීන 2. ජලය 3. ලිපිඩ 4. ඛණිජලවන 5. විටමින්

(02)

ජලය

ජලය (ඝන) ⟶ (ද්‍රව) ⟶ ජලය (වාෂ්ප)

ඉහත සඳහන් ක්‍රියාවලියේ භාවිතා වන මූලධර්මය වනුයේ,

1. වියළීම 2. විජලනය 3. ඌර්ධවපාතනය 4. ඝනීභවනය 5. ප්‍රතිඌර්ධවපාතනය

(03) ඉහත සඳහන් මූලධර්මය යොදා ගන්නා ආහාර පරිරක්ෂණ ක්‍රමවේදය වනුයේ,

1. ශීත වියළීම 2. ශීතනය 3. ජීවාණුහරණය 4. අධිශීතනය 5. පැස්ටරීකරණය

(04) ශිෂ්‍යයෙක් ක්ෂේත්‍රයෙන් බාධානොවූ පස් සාම්පලයක් ලබාගැනීමට හරස්කඩ වර්ගඵලය $30cm^2$ ක් වූ සිලින්ඩරයක් යොදා ගත්තේය. එයින් එකතු කළපස් සාම්පලයේ උස $10cm$ ක් විය. පස් සාම්පලය නියත බරක් ලැබෙන තුරු උඳුනේ වියලූ පසු එහි බර $400\ g$ කි. පස් සාම්පලයේ දෘෂ්‍ය ඝනත්වය වන්නේ,

1. $0.75\ \mathrm{g/cm^2}$ 2. $13\mathrm{g/cm^3}$ 3. $0.28\mathrm{g/cm^3}$ 3 4 $1.33\mathrm{g/cm^3}$ 5. දත්ත ප්‍රමාණවත් නොවේ.

(05) ජල පවිත්‍රාගාරයක ද්වීතියික මණ්ඩි වලින් කොටසක් නැවත ද්වීතියික පිරියම් ඒකක වෙත යොමු කරනුයේ,

1. පිරියම් ඒකකයට වැඩි ඔක්සිජන් ප්‍රමාණයක් ලබා දීමට.
2. කැටි ගැසීම හා සමූහනය කඩිනම් කිරීමට.
3. ද්වීතියික පිරියම් ඒකකය වැඩි බැක්ටීරියා ප්‍රමාණයක් ලබාදීමට
4. පිරියම් ඒකකයට වැඩි බැක්ටීරියා ප්‍රමාණයක් ලබාදීමට
5. අවසාදන ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම කිරීමට.

(06) කිරිවල අඩංගු ප්‍රදාන ප්‍රෝටීනය කුමක් ද?

1. වෙලීන් 2. ටැනික් 3. කේසින් 4. ලයිසින් 5. ලැක්ටෝස්

(07) වර්ෂාවකදී හෙක්ටයාර ඒකක භූමියකට ලැබුණු ජල පරිමාව $50m^3$ ක් විය. මෙම වර්ෂාපතනය උසක් ලෙස දක්වන්නේ නම් අගය වනුයේ,

1. $5mm$ කි. 2. $200\ mm$ කි. 3. $0.005\ mm$ කි. 4. $20\ mm$ කි. 5. $0.002\ mm$ කි.

(08) කිරිවල මේදය වෙන්කර ගැනිම සඳහා

1. Cream seperator භාවිතය වඩා යෝග්‍ය වේ.
2. ජලතාපකය භාවිතය සුදුසුය.
3. කේන්ද්‍රාපසරණය වඩා යෝග්‍ය වේ.
4. වියළීමට භාජනය කිරීම වඩාත් සුදුසු වේ.
5. *Yogurt Incubator* උපකරණය වඩා යෝග්‍ය වේ.

(09) ආහාරමය මත්ස්‍ය වගාවේදී පොකුණෙහි මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීමට යොදාගන්නා මත්ස්‍ය පැටවුන්ගේ වයස වනුයේ,

1. මාස 1 2. මාස $1-1\frac{1}{2}$ 3. මාස 3 4. මාස 2 - 3 5. මාස $2-2\frac{1}{2}$

(10) 'සිසිල් පැස්ටරීකරණය' ලෙස හඳුන්වන ආහාර සැකසීමේ නව ප්‍රවණතාවය වනුයේ,

1. සරු කිරීම 2. ආහාර අධිපීඩන සැකසීම 3. විද්‍යුත් ස්පන්දන තාපනය
4. පටල පෙරීම 5. අගය එකතු කිරීම

(11) 'සිසිල් ජීවාණුහරණය ' ලෙස හඳුන්වන ආහාර පරිරක්ෂක ක්‍රමවේදය වනුයේ,

1. අධිශීතනය 2. සාන්ද්‍රීකරණය 3. විසිරි වියළීම
4. දුම් ගැසීම 5. ප්‍රවිකිරණය

(12) පානීය ජලයේ සුදුසු pH පරාසය විය යුත්තේ,

1. $6.2-7.5$ය. 2. $5.5-6.6$ ය. 3. $6.8-7.8$ ය.
4. $5.8-6.5$ ය. 5. $6.5-4.8$ ය.

(13) පස් නියැදියක සත්‍ය සනත්වය සෙවීමේ පරීක්ෂණයකදී පහත සඳහන් දත්ත ලබා දී ඇත.

සනත්ව කුප්පියක ස්කන්ධය $= 40g$

සනත්ව කුප්පිය + පස් ස්කන්ධය $= 50$ g

ජලය + පස් + සනත්ව කුප්පියේ ස්කන්ධය $= 70g$

ජලය + සනත්ව කුප්පියේ ස්කන්ධය $= 65g$

මෙම පස් නියැදියේ සත්‍ය සනත්වය වනුයේ,

1. $2\ gcm^{-3}$ 2. $1.28\ gcm^{-3}$ 3. $3gcm^{-3}$
4. $2.5gcm^{-3}$ 5. $0.5gcm^{-3}$

(14) ඉහත සත්‍ය සනත්වය සෙවීමේ පරීක්ෂණයට යොදාගත් පස් නියැදියේ දෘශ්‍ය සනත්වය $1.6\ gcm^{-3}$ නම් එම පස් නියැදියේ සච්ඡිද්‍රතාවය වනුයේ,

1. 25% 2. 50% 3. 20% 4. 22% 5. 21.5%

(15) බුරුළු ප්‍රදාහයට ලක්වී ඇති දෙනකගේ කිරිදැයි හඳුනාගැනීමට සිදුකරනු ලබන පරීක්ෂණය වනුයේ,

1. Platform පරීක්ෂාව
2. Clot on Boiling පරීක්ෂාව
3. Resozurin පරීක්ෂාව
4. කිරිවල මේද ගෝලිකා නිරීක්ෂණය
5. ඇල්කොහොල් පරීක්ෂාව

(16) කිරිවල ප්‍රමාණාත්මක පරීක්ෂාවන් සිදුකිරීමට යොදා ගන්නා ලැක්ටොමීටරය ක්‍රමාංකයනය කර ඇති (නිවැරදි පාඨාංක ලබාදෙන ) උෂ්ණත්වය වනුයේ,

1. 10 ℃
2. −20℃
3. 15℃
4. 30℃
5. 25℃

(17) පැළ ගලවා සිටුවීමට ඔරොත්තු නොදෙන මූල පද්ධතියක් සහිත බෝග පැළ නිපදවා ගැනීමට සුදුසු තවාන් ක්‍රම වන්නේ,

1. උස් තවාන් සහ ගිල් වූ තවාන්
2. බඳුන් තවාන් සහ වැලි තවාන්
3. නොරිදෝකෝ සහ තැටි තවාන්
4. වැලි තවාන් සහ මට්ටම් තවාන්
5. ඩැපොග් තවාන් සහ නොරිදෝකෝ තවාන්

(18) දියගත වගාව (Hydroponics) යනු,

1. නිර්පාංශු වගා ක්‍රමයකි.
2. ජලය තුල ශාක වවන ක්‍රමයකි.
3. නිමග්න ජලජ භාක වවන ක්‍රමයකි.
4. පාවෙන ජලජ ශාක වවන ක්‍රමයකි.
5. මත්ස්‍යයන්ට ආහාරා ලෙස ශාක වවන ක්‍රමයකි.

(19) ආහාර නරක්වීම සඳහා වැඩිම බලපෑමක් ඇතිකරන ක්ෂුද්‍රජීවී කාණ්ඩය වනුයේ,

1. දිලීර
2. බැක්ටීරියා
3. ඇල්ගී
4. වෛරස්
5. ඒක සෛලික දිලීර විශේෂ

(20) මින් නිවැරදි සම්පන්ධතාවය වන්නේ,

1. සාපේක්ෂ ආර්ද්‍රතාවය – Illuminometer
2. වායුගෝලීය පීඩනය – Hydrometer
3. වාෂ්පීකරණය – Ceilometer
4. සූර්ය විකිරණතාවය – Pyranameter
5. පාංශු උෂ්ණත්වය – Mercury thermometer

(21) ස්වයංක්‍රීය කාලගුණික මධ්‍යස්ථානයක ගබඩා කරන ලද දත්ත විවිධ මාධ්‍යයන් ඔස්සේ ලබාදීම සිදු කරයි. එසේ තොරතුරු ලබාදෙන මාධ්‍යයක් නොවන්නේ,

1. USB
2. GSM
3. Wifi
4. GPRS
5. USD

(22) ත්‍රිමාන ඇඳීමක් සිදුකළ හැකි බිම් මැනීමේ ශිල්ප ක්‍රමය වනුයේ,

1. ලෝක ව්‍යාප්ත යාත්‍රාවරණ චන්ද්‍රිකා පද්ධතිය
2. තියොඩලයිට්ටුව භාවිතයෙන් බිම් මැනීම
3. මාලිමාව භාවිතයෙන් බිම් මැනීම.
4. ඉලෙක්ට්‍රෝනික දුරමැනීමේ ක්‍රමය
5. ඡායා රේඛනමිතිය

(23) පලතුරු ඉදීමේදී මැනිය නොහැකි සාධකයක් වන්නේ,

1. වර්ණය වෙනස්වීමයි
2. මුළු ඝන ද්‍රව්‍ය ප්‍රමාණය වෙනස් වීමයි.
3. මෘදු බව වෙනස් වීමයි.
4. මතුපිට වයනය වෙනස් වීමයි.
5. මදයේ pH අගය වෙනස් වීමයි.

(24) ආහාර පැසවීමේ කර්මාන්තයේ දී යොදා ගන්නා ලැක්ටික් අම්ල බැක්ටීරියාවන් නොවනේනේ,

1. Sterptococcus lgctis ය.
2. Aspergillus rizopus ය.
3. Lactobacillus bulgaricus ය.
4. Pediococus ceravisiae ය.
5. Streptococcus cremoris ය.

(25) පහත උපකරණ අතුරින් තල මේස මිනිතයේ දී සමාන්තරර රේඛා නිර්මාණය සඳහා යොදා ගනු ලබන උපාංගය වනුයේ,

1. දර්ශ රේඛය
2. රෝලින් රූල
3. මාලිමාව
4. ස්ප්‍රිතු ලේවලය
5. ලබ කරුව සහ ලබය